00111

ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව

නීතිවේදී උපාධි පාඨමාලාව - 03 වන මට්ටම

අවසාන පරීක්ෂණය - **2023/2024**

**LLU 3904 – නීති ක්‍රම**

කාලය - පැය **03**

දිනය: **2025** මැයි මස **17** | වේලාව : ප.ව. **01.30** – ප.ව. **04.30**

**මුළු ප්‍රශ්න ගණන : 08 කි.**

**අපේක්ෂකයන්ගේ අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.**

**I කොටසින් සහ II කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙක (02) බැගින් තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

## I කොටස – රෝම නීතිය

01. 'බොහෝ නූතන නීති පද්ධති වල පදනම වන රෝම නීතිය මගින්, බැඳීම් මූලික වශයෙන් පැන නගින්නේ ගිවිසුම් සහ දිලික්ත වලින් බවට හඳුනා ගනී.'

    ඉහත ප්‍රකාශය ඇසුරින් රෝම නීතියේ දැක්වෙන ගිවිසුම්ක බැඳීම්වල ස්වභාවය සහ වැදගත්කම සාකච්ඡා කරන්න. වලංගු ගිවිසුමක් සඳහා අත්‍යවශ්‍ය අංග, අර්ධ ගිවිසුම් වැනි අනෙකුත් ආකාර වල ගිවිසුම්ක බැඳීම් වලින් වෙන් කොට දක්වමින් පැහැදිලි කරන්න.

    (ලකුණු 20)

02. රෝම පුරවැසියෙකු සහ පීතෘ මූලිකයකු වන ටයිටස්, තම දරුවන් තිදෙනා ගෙන් දෙදෙනෙකු වන ලූෂියස් සහ කොර්නේලියා සිටියදී මියගියේය. ඔහුගේ වැඩිමහල් පුත්‍රයා වූ ගයස් ඔහුට පෙර මියගොස් සිටි අතර, ගයස් හට මාකස් නම් පුත්‍රයකු විය. ටයිටස් මිය යන විටත් මාකස් ටයිටස්ගේ පීතෘබලය යටතේ රැඳී සිටියේය. ටයිටස් විසින් ලූෂියස් සහ කොර්නේලියා ඔහුගේ තෙස්තමේන්තු දේපලට උරුමකරුවන් ලෙස අන්තිම කැමති පත්‍රය යටතේ නම් කල ද ඔහු තම මුනුබුරා වන මාකස් එයට ඇතුළත් නොකළේය. මාකස් වගකීම් විරහිතව ක්‍රියා කරන්නෙකු බවත් ඔහුට ලැබෙන ඕනෑම උරුම දේපලක් නාස්ති කිරීමට ඉඩ ඇති බවත් ටයිටස් විශ්වාස කළේය. කෙසේ වෙතත්, ටයිටස් ඔහුගේ අන්තිම කැමති පත්‍රයෙන් මාකස් උරුමකරුවකු ලෙස ඇතුලත් කිරීමක් හෝ ප්‍රකාශිතව උරුමයෙන් බැහැර කිරීමක් හෝ සිදු නොකළේය.

    අන්තිම කැමති පත්‍රයක් සහිත අනුප්‍රාප්තිය පිළිබඳ රෝම නීති මූලධර්ම ඇසුරෙන් ටයිටස්ගේ අන්තිම කැමති පත්‍රයේ නෛතික වලංගුභාවය සහ මාකස්ට ලබාගත හැකි ප්‍රතිකර්ම සාකච්ඡා කරන්න.

    (ලකුණු 20)

03. බෘටස් නම් අසල්වැසියාගේ ඉඩම සහ නිවසට යාබදව ප්ලියස් හට නිවසක් සහ ගොවිපළක් ඇත. ප්ලියස්ගේ ඉඩමේ පිහිටි ස්වභාවික බෑවුම නිසා ඔහුට බෘටස්ගේ ඉඩමෙහි උල්පත් ජලය ඇල මාර්ගයක් ඔස්සේ තම කුඹුරුවලට යැවීමේ පරවශ්‍යතාවයක් ඇත. හමුදා සේවයෙන් විශ්‍රාම ගැනීමෙන් පසු ප්ලියස් රෝමයේ පදිංචියට ගිය අතර, ඔහු තම බෑනා වන සෙවරස් හට තමාගේ දේපළවල ඵල ප්‍රයෝජනලාභී භුක්තිය ජීවිත කාලයටම පවරා දුන්නේය.

රෝම නීතිය යටතේ පහත සඳහන් අවස්ථාවල නෛතික තත්ත්වය සාකච්ඡා කරන්නः

අ) ප්ලියස් දේපලින් ඉවත් වූ විට පරවශ්‍යතාවයද අවසන් වූ බව පවසමින් බෘටස් ජලය ගලා යන ඇළ මාර්ගය අවහිර කළේය. හුදු ඵල ප්‍රයෝජනලාභියෙකු වන සෙවරස් හට එම අයිතිය බලාත්මක කළ නොහැකි බවට බෘටස් තර්ක කරයි. ,

(ලකුණු 06)

ආ) සෙවරස්, වතුයායෙන් නෙලා ගන්නා පලතුරු භාවිතා කරමින් ජෑම් නිෂ්පාදනය කර ඒවා යාබද නගරයේ අලෙවි කරයි. මෙම අලෙවියෙන් ලැබෙන ලාභය වහලයේ කොටසක් අලුත් වැඩියා කිරීම සඳහා ඔහු වෙන්කරයි.

(ලකුණු 06)

ඇ) සෙවරස්, අමතර ආදායමක් උපයා ගැනීම සඳහා නිවසේ කාමර දෙකක් අලුත විවාහ වූ යුවළකට කුලියට දුන් අතර, දේපළෙහි අලංකාරය වැඩි කිරීම සඳහා මාර්ගය දෙපස ඔලිව් ගස් සිටුවයි.

(ලකුණු 08)

04. පහත සඳහන් ඕනෑම <u>දෙකක්</u> පිළිබඳව සටහන් ලියන්න.

අ) *Dos*

ආ) *Manus* විවාහය

ඇ) *Contracts Verbis*

ඈ) *Quasi- Delicts*

(10x2=ලකුණු 20)

## <u>II කොටස – නීති ක්‍රම</u>

05. "නීති ශිෂ්‍යයාට, පුස්තකාලය යනු හුදෙක්ම දැනුම පිළිබඳ ගබඩාවක් නොවේ. ඔහුගේ වෘත්තියට අදාළ මෙවලම් එහි අඩංගුය. අදාළ නෛතික පොතපත ඍජුව පරිශීලනය කිරීමෙන් ලබන දැනුමට, තීක්ෂණ බුද්ධියට හා අත්දැකීමට ආදේශ කළ හැකි වෙන කිසිවක් නැත. අනෙකුත් විෂයයන් හදාරන ශිෂ්‍යයාට රසායනාගාරය යම්සේ ද නීති ශිෂ්‍යයාට පුස්තකාලය එබඳු වේ."

*LLU3904 නීති ක්‍රම පිළුව 1*, ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය, පි.7

ඉහත ප්‍රකාශය ඇසුරෙන් නෛතික පොතපතෙහි වැදගත්කම සාකච්ඡා කරන්න.

(ලකුණු 20)



57

06. වෙලෝරියා රාජ්‍යයේ 2022 අංක 09 දරණ පුද්ගලික දත්ත ආරක්ෂණ පනතේ 38 වගන්තිය මගින් පනතේ විධි විධාන හෝ ඒ යටතේ සාදන ලද ඕනෑම රෙගුලාසියක් උල්ලංඝනය කිරීම සඳහා දඬුවම් පැනවීම විස්තර කෙරේ.

වෙලෝරියා රාජ්‍යයේ 2022 අංක 09 දරණ පුද්ගලික දත්ත ආරක්ෂණ පනතේ 38(1) වගන්තියේ මෙසේ සඳහන් වේ:
"පාලකවරයකු හෝ දත්ත සකසන්නකු විසින්, 35 වන වගන්තියේ විධිවිධාන යටතේ නිකුත් කරනු ලැබූ විධානයකට අනුකූල වීමට අපොහොසත් වන අවස්ථාවක, දත්ත දායකයන් කෙරෙහි වන බලපෑම, අදාළ අනනුකූලතාවන් හි ස්වභාවය සහ ප්‍රමාණය සහ මේ පනතේ 39 වන වගන්තියේ සඳහන් කාරණා සැලකිල්ලට ගැනීමෙන් පසු, අධිකාරිය විසින්, එම පාලකවරයාට හෝ දත්ත සකසන්නාට එක් එක් අනනුකූලතාවක් සඳහා වෙලෝරියන් රුපියල් මිලියන දහයකට නොවැඩි දඩ මුදලක් ගෙවීමට දැන්වීමක් මගින් නියම කරනු ලැබිය යුතු ය."

ලියොන්, වෙලෝරියාවේ ජාතික සෞඛ්‍ය අධිකාරියේ දත්ත ඇතුළත් කිරීමේ නිලධාරියකු ලෙස සේවය කරයි. ඔහුගේ මිතුරෙකු වන එවන්ස්, රිය අනතුරකට ලක්ව සිහිසුන්ව රෝහල්ගත කර ඇති තම දියණියගේ වෛද්‍ය වාර්තා ලබා ගැනීම සඳහා ලියොන් වෙතින් හදිසි ඉල්ලීමක් කරයි. ඒ වන විට රෝහලේ අභ්‍යන්තර පද්ධතිය ක්‍රියා විරහිත වී තිබූ අතර ප්‍රතිකාර සඳහා අවශ්‍ය හදිසි අවසරය අදාළ නිලධාරීන්ගෙන් ලබාගත නොහැකිව තිබුණු බැවින්, එවන්ස්ගේ දියණියට අවශ්‍ය වූ හදිසි සැත්කමක් සඳහා ඇයව පුද්ගලික රෝහලකට මාරු කළ හැකි වන පරිදි ලියොන්, ඇයගේ පුද්ගලික දත්ත එවන්ස් වෙත ලබා දුන්නේය.

විධිමත් අනුමැතිය ලබාගැනීමකින් තොරව පුද්ගලික දත්ත හෙළි කිරීම සම්බන්ධයෙන් 2022 අංක 09 දරණ පුද්ගලික දත්ත ආරක්ෂණ පනතේ 38(1) වන වගන්තිය යටතේ ලියොන්ට චෝදනා එල්ල වී ඇත.

ව්‍යවස්ථා අර්ථ නිරූපණ රීති අනුසාරයෙන් ලියොන්ගේ නෛතික තත්ත්වය සාකච්ඡා කරන්න. අදාළ නඩු තීරණ දක්වමින් ඔබගේ තර්කයන් තහවුරු කරන්න.

(ලකුණු 20)

07. සාම්ප්‍රදායික රිදී ආභරණ තැනීමේ කර්මාන්තයට ප්‍රසිද්ධ රන්මුතු දූව නැමැති ඈත ගම්මානයේ දරුවන් කුඩා කල සිටම තම දෙමාපියන් සමඟ ආභරණ සෑදීමේ කාර්යය සඳහා එක්වීම සිරිතක් ලෙස පැවතියේය. මෙම සිරිත මගින් රිදී ආභරණ සෑදීමේ පාරම්පරික කුසලතා සහ සංස්කෘතික උරුමය ආරක්ෂා කරන බවට විශ්වාසයක් පවතින අතර, ගමේ වැඩිහිටියන් පවසන අන්දමට මෙම ශිල්පය ඉගෙනීම විධිමත් අධ්‍යාපනය ලබන්නා සේම වටිනා දෙයකි. මෙම ගම්මානයේ සිටින වයස අවුරුදු දහයක් සහ දොළහක් වන නිමල් සහ කමල් නැමැති දරු දෙදෙනා පාසල් නොයති. දක්ෂ ශිල්පීන් දෙදෙනෙකු වන ඔවුන්ගේ දෙමාපියන් දැඩි ලෙස විශ්වාස කරන්නේ, ගමේ රිදී ආභරණ සෑදීමේ කර්මාන්තයේ අඛණ්ඩ පැවැත්ම සහතික කිරීම සඳහා දරුවන් වර්ධනය වන වියේදීම එම කර්මාන්තය සඳහා ක්‍රියාකාරී ලෙස සහභාගි වීම වැදගත් වන බවයි.
කෙසේ වෙතත්, ජාතික අධ්‍යාපන පනත යටතේ දක්වා ඇති අනිවාර්ය අධ්‍යාපනය පිළිබඳ නීති සහ ආඥාපනත් ව්‍යවස්ථාවේ සඳහන් කර ඇති දරුවන්ගේ අධ්‍යාපන අයිතිය දක්වමින් පාසල් බලධාරීන් මේ පිළිබඳව ඔවුන්ගේ කනස්සල්ල පළ කර ඇත. ඔවුන් තර්ක කරන අන්දමට සම්ප්‍රදායික චාරිත්‍ර වාරිත්‍ර වැදගත් වුවද ඒවා දරුවන්ගේ විධිමත් අධ්‍යාපනය කෙරෙහි ඇති නීතිමය බැඳීම අභිබවා නොයා යුතුය. දරුවන් පාසලට ඇතුලත් නොකර ඇත්නම් හා දිනපතා පාසල් නොයන්නේ නම් නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බවට අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මේ වන විට ගම්වැසියන්ට අනතුරු අඟවා ඇත.



59

ආභරණසෑදීම සඳහා දරුවන් සහභාගි වීමේ ඔවුන්ගේ චාරිත්‍රය දිගු කලක් තිස්සේ පවතින බැවින් හා එම චාරිත්‍රය සමාජීයව තහවුරු කර ඇති බැවින්ද, චාරිත්‍රානුකූල නීතිය හා සංස්කෘතික අයිතිවාසිකම් යටතේ මෙය ආරක්ෂා විය යුතු බවට ගම්වැසියෝ අවධාරණය කරති.

ඔවුන්ගේ මෙම චාරිත්‍රය සාධාරණීකරණය කරමින් නීත්‍යානුකූල වලංගු චාරිත්‍රයක් ලෙස එය තහවුරු කරගත හැකිද යන්න පිළිබඳව ගම්වැසියන්ට උපදෙස් දෙන්න. චාරිත්‍රයක් නීතියක් ලෙස පිළිගැනීම සඳහා සම්පූර්ණ කළ යුතු අවශ්‍යතා සහ අදාළ නඩු තීරණ ඇසුරින් ඔබේ පිළිතුර විස්තර කරන්න.

(ලකුණු 20)

08. පහත සඳහන් ඕනෑම දෙකක් පිළිබඳව සටහන් ලියන්න.

අ) *Stare Decisis*

ආ) විනිශ්චිත තීරණයක් අධිතීරණය කිරීම

ඇ) *Ratio decedendi*

ඈ) *Obiter dicta*

(10x2=ලකුණු 20)

*** හිමිකම් ඇවිරිණි***



61